# අර්ථ සංවර්ණණා ක්‍රම සංඛ්‍යාත ප්‍රකීර්ණක දේශනාව අට්ඨකථාසේ හැඳින්වීම පිළිබඳ විමසුමක්

කන්දේගම කමලවංසාලංකාර හිමි[1]

තෙවළා දහම්හි අර්ථග්‍රහනයට අපහසු පද සංකල්පය නොයෙක් අයුරින් නිවැරදිව හා සුගමව අවබෝධය සඳහා කරන ලද කෘති අට්ඨකථා වශයෙන් විවරණය කොට ඇත. ඒ සඳහා ''අත්ථ සංවණ්ණනා'' යනුවෙන් ද භාවිත කොට ඇති බව සමන්ත පාසාදිකා විනය අටුවාවෙන් දැකිය හැකි වේ. මෙම අටුවා කරණයෙහි ආරම්භය පිළිබඳව නොයෙක් මතයන් ප්‍රකට වුව ද අටුවා ටීකා ඇඳුරු මතය වන්නේ එය බුද්ධ කාලයේහිම ආරම්භ වූ බවකි.

පෙළ තුළ ''අත්ථ'' යන පදය දැකිය හැකිය හැකි නමුත් එය ''කථා'' යන පදය සමග යොදාගත් අයුරක් නොදැක්වේ. ''අත්ථ, ධම්ම, අත්ථ කුසල, අත්ථ සම්පරායික, අත්ථ ධම්මස්ස කොවිදො, අත්ථං මන්ථයිත්‍වා, දිට්ඨ ධම්මිකානං අත්‍ථං,'' ආදී අන්‍ය පදයන් සමග යොදාගෙන ඇති බව ප්‍රකටය. එයින් අට්ඨ කථා හෙවත් අර්ථ වර්ණනා පිළිබඳව නොදැක් වුනද යම් අයුරකින් අර්ථය ග්‍රහණය කළ යුතු ආකාරයක් දක්වා ඇති බව ගම්‍යමාන වේ. එයින් සංකල්පමය වශයෙන් අර්ථ කථා පිළිබඳව යම් ඉඟියක් දක්වා ඇති ව සිතිය හැකිය.

සාරත්ථදීපනී විනය ටීකාව අට්ඨකථා යන්න විවරණය කරනු ලබන්නේ'' අර්ථ ප්‍රකාශ කරනු ලබන බැවින් අත්‍ථ කථා නම් වේ. එසේම ''ත්‍ථ'' කාරයට ''ට්ඨ'' කොට අට්ඨ කථා වශයෙන් භාවිත වේ. යනුවෙනි. මෙම විග්‍රහට අනුව ''අර්ථය කියනු ලැබේ'' යනු අර්ථයෙන් ''අට්ඨ කථා'' යන නාමය භාවිත වී ඇති බව පෙනේ.

අට්ඨ කථාවන්හී ප්‍රධාන අභිප්‍රායවන්නේ පෙළෙහි බ්‍යඤ්ජනාර්ථය, පදගතාර්ථය, නිදානය, වත්ථු හා සම්බන්ධ යන කරුණු පිළිබඳව විවරණය කිරීම බව ලීනත්ථප්පකාසිනී නම් වූ දීඝ නිකාය ටීකාව ප්‍රකාශ කරයි. මේ පිළිබඳව අවධානය යොමු කරනු ලබන අටුවා ටීකා ආචාර්යවරු අටුවා හෙවත් අට්ඨකථා ප්‍රභවයේ ආදී කර්තෘ බුදුරදුන් බව ප්‍රකට කරති. ඒ පිළිබඳව විවරණයක් සපයන සාරත්ථදීපනි ටීකාව දක්වන්නේ ''බුදුරදුන් ඒ ඒ ස්ථානයන් හී දී විස්තර සහිතව දේශනා කළ පකිර්ණක දේශනාවන් අට්ඨකථා නම් වේ'' යනුවෙනි. මෙම අදහසට විමති විනොදනි විනය ටීකාව දක්වා ඇති අයුරු දැකිය හැකි වේ. එහි අට්ඨකථාවන්හී පිළිවෙලින් සංග්‍රහ කොට ඇති බැව් දැකිය හැකිය. මෙබඳු වූ ''පකිර්ණක'' දේශනා අට්ඨකථාවන්ගේ මූලයයි. යනුවෙනි. මෙයින් ගම්‍යමාන වන්නේ අට්ඨකථා වශයෙන් පශ්චාත් කාලීන සංවර්ධනයට පත් වූයේ බුදු රදුන්ගේ ''පකිර්ණක'' දේශනා බවයි.

පෙළ තුළ වන ''පකිර්ණක'' දේශනා කවරේද යන්න පැහැදිලි විවරණයක් අටුවා ටීකා තුළ දක්නට නොලැබේ. දේශනා පිළිබඳව පැහැදිළි අර්ථ කථනයක් දැකිය නොහැකිය. මා මෙහි දී උත්සහ ගනු ලබන්නේ පෙළෙහි යථෝක්ත අර්ථ වර්ණනා සංඛ්‍යාත ප්‍රකීර්ණක දේශනාව කවර ආකාරයකින් වූවේ දැයි යම් බඳු ප්‍රාමාණික පූර්විකාවක් දැක්වීමටය.

**ප්‍රමුඛ පද** : පකිර්ණක, අර්ථ සංවර්ණනා ක්‍රම, අට්ඨ කතා, පෙළ,

---

1 B.A.Hons (Peradeniya)/ M.A (BPU), PGD(BAC) M.A(BAC)
මනෝවිද්‍යා උපදේශක, ජාතික උපදේශන මධ්‍යස්ථානය, සමාජ සේවා අමාත්‍යාංශය